# ඡන්ද හිමියන්ගේ දිනය - 2025

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

# ප්‍රධාන නාමලේඛනය සැකසීම

- 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තියට අනුව 2025 වසරේ ඡන්ද හිමියන් ගණන් ගැනීම 2025 ජනවාරි මස 01 වන දින ආරම්භ කරන ලදී.
- ඡන්ද හිමියන්ගේ සුදුසුකම් ලැබීමේ දිනය - 2025 වර්ෂයේ පෙබරවාරි මස 01 දින
- 2007 ජනවාරි මස 31 වන දින හෝ එයට පෙර උපන් අය විය යුතුය

# ඡන්දහිමියෙකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම.
- ඡන්දහිමි නාමලේඛයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සුදුසුකම් ලබන දිනයට සාමාන්‍ය පදිංචිය තිබීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් ඡන්ද බලය අහිමිවීමේ නුසුදුසුදුකම් වලට යටත් නොවූ තැනැත්තෙක් විය යුතුය.

- 2025 වර්ෂයේ ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගැනීමේ නිලධාරී සෑම ගෘහයකටම යෑම සිදු නොවන අතර "අ" සහ "ආ" ලැයිස්තු යාවත්කාලීන කිරීම සඳහා තොරතුරු එක්රැස්කිරීමට පමණක් ගෘහ වෙත යෑම සිදුකරයි.
- 2021 සහ 2022 වර්ෂවලදී ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා මෙම ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

# ER ආකෘතියක් සම්පූර්ණ කළයුතු අවස්ථා

- 2024 වර්ෂයේ නාමලේඛනයේ ඇතුළත්ව නොමැති තැනැත්තන්;
  - අවුරුදු 18 සම්පූර්ණ වූ
  - අළුතින් පදිංචියට පැමිණි අය

  වැනි හේතු මත අළුතින් ඇතුළත් විය යුතු තැනැත්තන්
- 2024 වර්ෂයේ නාමලේඛනයේ ඇතුළත්ව ඇති නමුත්
  - මිය යාම
  - පදිංචිය හැර යාම

  වැනි හේතු මත ලියාපදිංචි කිරීමට නුසුදුසු තැනැත්තන්

නොපමාව ගණන් ගැනීමේ නිලධාරී (ග්‍රාම නිලධාරී) විමසන්න.

# හිමිකම් හා විරෝධතා

- ඉවත්වීමේ ලැයිස්තු (“අ”) හා ඇතුලත්වීමේ ලැයිස්තු (“ආ”) ලැයිස්තු පිළියෙල කර එය දින 28ක් ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.
- එම කාලය තුළ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.
- මේ සඳහා ඉදිරියේදී ප්‍රසිද්ධ දැන්වීම් නිකුත් කරනු ඇත.

- ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා සාමාන්‍ය පදිංචිය පමණක් ප්‍රමාණවත් වන අතර දේපල අයිතිය අවශ්‍ය නොවේ.
- කුලී හෝ බදු නිවැසියන් මෙන්ම අනවසර පදිංචි කරුවන්ට අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම් තමන් සාමාන්‍ය පදිංචි ලිපිනයේ ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි විය හැක.
- කූලී නිවැසියන් හෝ බදු නිවැසියන් හෝ අනවසර පදිංචි කරුවන් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි කිරීම පුරවැසියන්ගේ ඡන්දබලය තහවුරු කිරීම සඳහා පමණක් වන අතර, එම ලියාපදිංචි කිරීම දේපල අයිතිය හෝ ස්ථිර පදිංචිය තහවුරු කර ගැනීම සඳහා නොවන බවද අවධාරණය කරනු ලැබේ.

# පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම

| පරිපූරක ඡන්දහිමි නාමලේඛනය | අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය | උපන්දිනය |
|---|---|---|
| 2025 (1) | 2025.02.01 සිට 2025.05.31 දක්වා | 2007.02.01 සිට 2007.05.31 දක්වා |
| 2025 (2) | 2025.06.01 සිට 2025.09.30 දක්වා | 2007.06.01 සිට 2007.09.30 දක්වා |
| 2025 (3) | 2025.10.01 සිට 2026.01.31 දක්වා | 2007.10.01 සිට 2008.01.31 දක්වා |

# පරිපූරක ඡන්දහිමි නාමලේඛනය 2026

| පරිපූරක ඡන්දහිමි නාමලේඛනය | අවුරුදු 18 සම්පූරණ කළ යුතු කාල පරිච්ඡේදය | උපන්දිනය |
|---|---|---|
| 2026 (1) | 2026.02.01 සිට<br>2026.05.31 දක්වා | 2008.02.01 සිට<br>2008.05.31 දක්වා |
| 2026 (2) | 2026.06.01 සිට<br>2026.09.30 දක්වා | 2008.06.01 සිට<br>2008.09.30 දක්වා |
| 2026 (3) | 2026.10.01 සිට<br>2027.01.31 දක්වා | 2008.10.01 සිට<br>2009.01.31 දක්වා |

# ඡන්ද හිමියන්ගේ දිනය

- ඡන්ද හිමියන්ගේ සුදුසුකම් ලැබීමේ දින - ඡන්ද හිමියන්ගේ දිනය
- 2013 ආරම්භ කරන ලදී.
- මෙවර තේමාව

‘‘සියළුදෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය තුළ තරුණයන් සහ කාන්තාවන් බලගැන්වීම’’

- ඡන්ද හිමියන්ගේ දිනය තුළ දී ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. එහිදී පහත සමාජ කොටස් කෙරෙහි විශේෂ අවධානය යොමුකර එම කොටස් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සක්‍රීයව හවුල් කර ගැනීම ඡන්ද හිමියන්ගේ දින වැඩසටහන්වල මුඛ්‍ය පරමාර්ථයක් වී තිබේ.
  - කාන්තා පුරවැසියන්
  - යොවුන් පුරවැසියන්
  - අබාධිත පුරවැසියන්
  - ආන්තික ජනප්‍රජාව නියෝජනය කරන පුරවැසියන්
- සෑම වසරකම ඡන්ද හිමියන්ගේ දිනයට සමගාමීව මෙම සමාජ කොටස් ද ඉලක්ක කරගෙන වැඩමුළු සංවිධානය කරනු ලැබේ.

# 2015 - සිට 2022 දක්වා සිදුකරන ලද ඡන්ද හිමියන්ගේ දිනයට අදාල කාර්යයන් කිහිපයක්














ශ්‍රීලංකා - මැතිවරණ
සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය
ජන්දබලය මත රැඳා පවතී
2018 ජන්ද හිමියන්ගේ දිනය සමරමු.
















Advanced Level
2019
BIOLOGY
Island First

# 2024 - ”කතිරයට පළමු පියවර”
## ඔබේ ඡන්දය රටට තීරණාත්මකයි.!
## අපි ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වෙමු!

